<u>මධ්‍යම පළාත් සභාවේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණය (SL 1-2006) යටතේ වන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සංශෝධන අංක - 02</u>

<table>
<tr><th>ඡේද අංකය</th><th>දැනට පවතින පෙළ</th><th>ඡේද අංකය</th><th>යෝජිත සංශෝධනය</th><th>සංශෝධනයට හේතුව</th></tr>
<tr><td>03<br>3.2</td><td>නිලධර ගණය පිළිබඳ විස්තර<br>ශ්‍රේණි : III, II හා I ශ්‍රේණි</td><td>03<br>3.2</td><td>නිලධර ගණය පිළිබඳ විස්තර<br>ශ්‍රේණි : III හා II ශ්‍රේණි</td><td>අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත්තේ III හා II ශ්‍රේණි පමණක් බැවින්</td></tr>
<tr><td>05<br>5.1<br>5.2<br>5.3</td><td>වැටුප්<br>වැටුප් කේත අංකය : SL 1-2006<br>මාසික වැටුප් පරිමාණය : 22,935 - 10 x 645-8 x 790 – 53,555/-<br>ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :
<table>
<tr><th>ශ්‍රේණිය</th><th>වැටුප් පියවර</th><th>වැටුප් තලය රු.</th></tr>
<tr><td>III</td><td>01</td><td>22,935/=</td></tr>
<tr><td>II</td><td>12</td><td>30,175/=</td></tr>
<tr><td>I</td><td>20</td><td>36,755/=</td></tr>
</table></td><td>05<br>5.1<br>5.2<br>5.3<br>5.4</td><td>වැටුප්<br>වැටුප් කේත අංකය : SL 1-2016<br>මාසික වැටුප් පරිමාණය : 47,615 – 10-1,335- 8 x 1,630 – රු.74,005/-<br>ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :
<table>
<tr><th>ශ්‍රේණිය</th><th>ආරම්භක වැටුප් පියවර</th><th>වැටුප් තලය රු.</th></tr>
<tr><td>III</td><td>01 පියවර</td><td>47,615/-</td></tr>
<tr><td>II</td><td>12 පියවර</td><td>62,595/-</td></tr>
</table>
වැටුප් ගෙවීම හා අදාළ අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුකූලව විය යුතුය.</td><td>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 සහ ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයන්හි විධිවිධාන වෙනුවට 2016.01.01 දින සිට රාජ්‍ය සේවයේ තනතුරු සඳහා ක්‍රියාත්මක වන නව වැටුප් පරිමාණය අදාළ කරගනිමින් ක්‍රියාත්මක වන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධානවලට අනුකූලව වැටුප් සංශෝධනය කර ඇත.</td></tr>
</table>

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024.01.16 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

<table>
<tr>
<td>7.4.2.4</td>
<td>2. සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්නතම වසර (05) තුළම සතුටුදායක සේවා කාලයක් හා කාර්ය සාධනය සතුටුදායක හෝ ඉන් ඉහළ මට්ටමක තිබිය යුතුය.</td>
<td>7.4.2.4</td>
<td>2. සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සක්‍රිය සේවා කාලයක් හා කාර්ය සාධනය සතුටුදායක හෝ ඉන් ඉහළ මට්ටමක තිබිය යුතුය.<br><br>3. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.</td>
<td>දැනට අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සක්‍රිය සේවා කාලයක් අවශ්‍ය බවට සඳහන් නොවුන ද සක්‍රිය සේවා කාලය සලකා බැලීම නව බඳවා ගැනීම් වලදී අවශ්‍යතාවයක් වන බැවින් එම විධිවිධාන ඇතුළත් කිරීම.</td>
</tr>
<tr>
<td></td>
<td>කාර්යක්ෂමතා කඩඉම<br>8.1
<table>
<tr><th>කුමන කාර්යක්ෂමතා කඩ ඉමද යන වග</th><th>කාර්යක්ෂමතා කඩ ඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද</th><th>කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව/ වෙනත්</th></tr>
<tr><td>1 වන කාර්යක්ෂමතා කඩඉම</td><td>III ශ්‍රේණියට පත් වී / අන්තර්ග්‍රහණය වී වසර තුන (03) ක් ගතවීමට පෙර</td><td>ලිඛිත (ඇමුණුම 02)</td></tr>
<tr><td>2 වන කාර්යක්ෂමතා කඩඉම</td><td>II ශ්‍රේණියට උසස් වී / අන්තර්ග්‍රහණය වී වසර තුන (03) ක් ගතවීමට පෙර</td><td>ලිඛිත (ඇමුණුම 03)</td></tr>
<tr><td>3 වන කාර්යක්ෂමතා කඩඉම</td><td>I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර</td><td>ලිඛිත (ඇමුණුම 04)</td></tr>
</table>
</td>
<td></td>
<td>කාර්යක්ෂමතා කඩඉම<br>8.1
<table>
<tr><th>කුමන කාර්යක්ෂමතා කඩ ඉමද යන වග</th><th>කාර්යක්ෂමතා කඩ ඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද</th><th>කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය /ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලා/ වෙනත්</th></tr>
<tr><td>1 වන කාර්යක්ෂමතා කඩඉම</td><td>III ශ්‍රේණියට පත් වී / අන්තර්ග්‍රහණය වී වසර තුන (03) ක් ගතවීමට පෙර</td><td>ලිඛිත (ඇමුණුම 02)</td></tr>
<tr><td>2 වන කාර්යක්ෂමතා කඩඉම</td><td>II ශ්‍රේණියට උසස් වී / අන්තර්ග්‍රහණය වී වසර තුන (03) ක් ගතවීමට පෙර</td><td>ලිඛිත (ඇමුණුම 03)</td></tr>
</table>
<br>ගරු ආණ්ඩුකාරතුමා විසින්<br>2024. 01. 16 දින<br>අනුමත කරන ලදී.<br>ආණ්ඩුකාර ලේකම්
</td>
<td>අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා අනුමත කර ඇත්තේ III හා II ශ්‍රේණි පමණක් වන බැවින් 3 වන කාර්යක්ෂමතා කඩ ඉමට අදාළ තොරතුරු අදාළ නොවන බැවින් ඉවත් කිරීම.</td>
</tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| 10.1 | III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම<br><br>IV. උසස් වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | 10.1 | III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම<br><br>IV. උසස් වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය. | රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි විධිවිධාන අනුව |
| 10.2 | II ශ්‍රේණිය යේ සිට I ශ්‍රේණියට උසස් කිරීම | 10.2 | ඉවත් කර ඇත. | අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා අනුමත කර ඇත්තේ III හා II ශ්‍රේණි පමණක් වන බැවින් I ශ්‍රේණියට උසස් කිරීමේ විධිවිධාන අදාළ නොවන බැවින් ඉවත් කර ඇත. |
| 10.2.1 | පූර්ව අවශ්‍යතා<br><br>I. කළමනාකරණ හෝ සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br>II. නිලධර ගණයේ II ශ්‍රේණියේ වසර හත (07) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හත (07) ක් උපයාගෙන තිබීම.<br>III. පූර්වාසන්න වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>IV. අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර හත (07) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.<br>V. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.<br><br>උසස් කිරීමේ ක්‍රමය : | 10.2.1 | ඉවත් කර ඇත. | |
| 10.2.1.1 | සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් විසින් නියමිත ආකෘති පත්‍රය මඟින් පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට , පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. | 10.2.1.1 | ඉවත් කර ඇත. | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2024.01.16 දින අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම - 01

<u>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ ආකෘතිය</u>

02. ලකුණු ලබා දිය යුතු ක්ෂේත්‍ර

| පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| <u>අධ්‍යාපන සුදුසුකම් - ලකුණු 10</u><br>රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ආයතනයක පශ්චාත් උපාධියක් ලබා තිබීම - ලකුණු 06<br>රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම - ලකුණු 04 | 10 | අදාළ නොවේ |
| <u>වෘත්තීය සුදුසුකම් - ලකුණු 20</u><br>01. දේශීය පාඨමාලා - ලකුණු 10<br>රජයේ පිළිගත් ආයතනයක් (SLIDA, "INGAF",NICD) විසින් පවත්වනු ලබන කළමනාකරණ හෝ ඒ හා සමාන වසරක් හෝ ඊට වැඩි කාලයකට අදාළ ඩිප්ලෝමාවක් හෝ උසස් ඩිප්ලෝමාවක් සමත් වීම.<br>02. වෙනත් දේශීය / විදේශීය පාඨමාලා - උපරිම ලකුණු 10<br>බඳවා ගැනීමේදී සළකා බලනු ලබන මූලික වෘත්තීය සුදුසුකම්වලට හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට අදාළ ඩිප්ලෝමා පාඨමාලාවලට අමතරව හදාරන ලද වෘත්තීය විෂයගත පාඨමාලා | 20 | |

ඇමුණුම - 01

<u>මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරට බඳවා ගැනිම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ ආකෘතිය</u>

02. ලකුණු ලබා දිය යුතු ක්ෂේත්‍ර

| අනු අංක | පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු |
|---|---|---|
| 01 | <u>අධ්‍යාපන සුදුසුකම් - උපරිම ලකුණු 15</u><br>රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ආයතනයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම - ලකුණු 15<br>රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ආයතනයකින් උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම - ලකුණු 12<br>(ඉහළම සුදුසුකමට පමණක් ලකුණු පිරිනැමේ.) | 15 |
| 02 | <u>වෘත්තීය සුදුසුකම්</u><br>01. දේශීය (රජයේ පිළිගත් ආයතනයක් විසින් පවත්වනු ලබන කළමනාකරණ හෝ ඒ හා සමාන පාඨමාලා) / විදේශීය පාඨමාලා - උපරිම ලකුණු 08<br>බඳවා ගැනිමේදී සළකා බලනු ලබන මූලික වෘත්තීය සුදුසුකම්වලට හා කාර්යක්ෂමතා කඩඉම් විභාග වලට අදාල ඩිප්ලෝමා පාඨමාලා වලට අමතරව හදාරන ලද වෘත්තීය විෂය ගත පාඨමාලා<br>I. අවුරුදු 01 ක් හෝ ඊට වැඩි කාලසීමාවකට අදාළ දේශීය / විදේශීය පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම. - ලකුණු 08 | |

2014.07.08 දිනැතිව අනුමත බඳවා ගැනිමෙ හා උසස් කිරීමෙ පරිපාටියෙහි (ඇමුණුම 01) ලකුණු පරිපාටියෙහි අධ්‍යාපන සුදුසුකම් යටතේ පශ්චාත් උපාධිය හා උපාධිය යන සුදුසුකම සඳහා ලබා දී ඇති ලකුණු ප්‍රමාණයට වඩා වෘත්තීය සුදුසුකම් යටතේ ලබා දී ඇති ලකුණු ප්‍රමාණය වැඩි වීම නිසා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන්ට අගතියක් වීම වැළැක්වීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2024.01.16 දින අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1. දින 90ට වැඩි දේශීය / විදේශීය පාඨමාලාවක් හදාරා තිබීම<br>- ලකුණු 10<br><br>2. දින 30 ට වැඩි දේශීය / විදේශීය පාඨමාලාවක් හදාරා තිබීම<br>- ලකුණු 05<br><br>3. දින 10 ට වැඩි දේශීය / විදේශීය පාඨමාලාවක් හදාරා තිබීම<br>- ලකුණු 03<br><br>4. දින 05 ට වැඩි දේශීය / විදේශීය පාඨමාලාවක් හදාරා තිබීම<br>- ලකුණු 02 | | | | | II. මාස 06 ක් හෝ ඊට වැඩි සහ අවුරුදු 01 කට අඩු දේශීය / විදේශීය පාඨමාලාවක් හදාරා තිබීම .<br>- ලකුණු 06<br><br>III. මාස 01 ක් හෝ ඊට වැඩි සහ මාස 06 කට අඩු දේශීය / විදේශීය පාඨමාලාවක් හදාරා තිබීම.<br>- ලකුණු 04<br><br>IV. දින 05 ක් හෝ ඊට වැඩි සහ මසකට අඩු දේශීය / විදේශීය පාඨමාලාවක් හදාරා තිබීම.<br>- ලකුණු 02<br><br>(උපරිම සුදුසුකම යටතේ එක් පාඨමාලාවකට පමණක් ලකුණු පිරිනැමේ) | 08 | |
| | | | | | | 02 මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයෙහි සමූපකාර සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සමූපකාර සංවර්ධන නිලධාරී සේවයේ I ශ්‍රේණියට අදළ III වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමට සහන සළසා ඇති නමුත් එකී සහනය හිමි III වන කාර්යක්ෂමතා කඩඉමට අදළ වවන 5000 ක පර්යේෂණ නිබන්ධනය ඉදිරිපත් කර ඉන් සමත් වී තිබීම.<br>- උපරිම ලකුණු 02 | 02 | මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයෙහි සමූපකාර සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සංශෝධන අංක 01 අනුව එකී පරිපාටියේ 15.2 වගන්තිය යටතේ හිමි සහනය අදාළ වන නමුත් III වන කාර්යක්ෂමතා කඩඉමට අදාළ වවන 5000 පර්යේෂණ නිබන්ධනය 2022.08.12 දින වන විට ඉදිරිපත් කර ඉන් සමත් වී ඇති නිලධාරීන්ට වන අගතිය වැළැක්වීම සඳහා. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024. 01. 16 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 03. මූලික සුදුසුකම් වලට අමතරව විෂය ක්ෂේත්‍රයට අදාළව සම්පූර්ණ කර ඇති පර්යේෂණ නිබන්ධන (එක් නිබන්ධනයක් සඳහා - උපරිම ලකුණු 03<br><br>04. 230 B පොදු ආකෘතියෙන් ලබා ඇති ප්‍රශංසා සහතික සඳහා එක් සහතිකයකට ලකුණු 01 බැගින් - උපරිම ලකුණු 05<br><br>(මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන නිලධාරී I ශ්‍රේණියට පත් වූ දින සිට ලබා ගත් සහතික පත්‍ර සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | 03<br><br>05 | මෙම තනතුර විධායක ශ්‍රේණියේ තනතුරක් වන බැවින් වෘත්තිය නිපුණත්වය නිර්ණය කිරීම සඳහා |
| | <u>පළපුරුද්ද - ලකුණු 60</u><br><br>1. සුදුසුකම් සළකා බලන දිනට සමූපකාර සංවර්ධන නිලධාරී (විශේෂ ශ්‍රේණියේ) / දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන නිලධාරියෙකු ලෙස පත්වීම් ලබා ඇති නිලධාරියෙකු සඳහා විශේෂ ශ්‍රේණියේ වසරක් සඳහා ලකුණු 10 බැගින් වසර 03 ක් සඳහා ද,<br><br>සමූපකාර සංවර්ධන නිලධාරී I ශ්‍රේණියේ වසර පහක් (05) ඉක්මවූ පසු එළඹෙන සෑම වසරක් සඳහාම ලකුණු 06 බැගින් ද තනතුරු දෙකෙහිම උපරිම වසර 08 කට ලකුණු හිමි වේ.<br><br>(වසරකට අඩු සේවා කාලයක් ඇති විට මාස 06 ක් හෝ ඊට වැඩි නම් වසරකට හිමි ලකුණු ප්‍රමාණයෙන් අඩක් හිමි වේ.) | | | | 03 | <u>පළපුරුද්ද - ලකුණු 60</u><br><br>1. සුදුසුකම් සළකා බලන දිනට සමූපකාර සංවර්ධන නිලධාරී (විශේෂ ශ්‍රේණියේ / දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන නිලධාරියෙකු ලෙස පත්වීම් ලබා ඇති නිලධාරියෙකු සඳහා විශේෂ ශ්‍රේණියේ වසරක් සඳහා ලකුණු 10 බැගින් වසර 03 ක් සඳහා ද,<br><br>සමූපකාර සංවර්ධන නිලධාරී I ශ්‍රේණියේ වසර පහක් (05) ඉක්මවූ පසු එළඹෙන සෑම වසරක් සඳහාම ලකුණු 06 බැගින් ද තනතුරු දෙකෙහිම උපරිම වසර 08 කට ලකුණු හිමි වේ.<br><br>(වසරකට අඩු සේවා කාලයක් ඇති විට මාස 06 ක් හෝ ඊට වැඩි නම් වසරකට හිමි ලකුණු ප්‍රමාණයෙන් අඩක් හිමි වේ.) | 60 | 2014.07.08 දිනැතිව අනුමත කර ඇති සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි (ඇමුණුම 01) ලකුණු පරිපාටියෙහි ලකුණු නිර්ණායක අංක කර නොමැති නිසා අනු අංක 01 සිට අනු අංක 06 දක්වා ලකුණු නිර්ණායක අංක කර ඇත. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024.01.16 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

| | | |
|---|---|---|
| <u>භාෂා ප්‍රවීණතාව - ලකුණු 05</u><br><br>(සන්ධාන භාෂාවේ හා අනෙක් රාජ්‍ය භාෂාවේ ප්‍රවීනතාවය)<br><br>රජය පිළිගත් ආයතනයක හදාරන ලද ඉංග්‍රීසි භාෂා පාඨමාලා<br><br>1. ඩිප්ලෝමා - ලකුණු 03<br><br>2. සහතික පත්‍ර පාඨමාලා / අ.පො.ස. සාමාන්‍ය පෙළ සම්මාන - ලකුණු 02 | 05 | |
| <u>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය - ලකුණු 05</u><br><br>(නායකත්වය, පෞරුෂත්වය, සන්නිවේදන කුසලතා, ආකල්ප යනාදිය සළකා බලනු ලැබේ) | 05 | |

| | | | |
|---|---|---|---|
| 04 | <u>භාෂා ප්‍රවීණතාව - ලකුණු 02</u><br><br>රජය පිළිගත් ආයතනයක හදාරන ලද ඉංග්‍රීසි භාෂා පාඨමාලා සඳහා - උපරිම ලකුණු 02 | 02 | |
| 05 | <u>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය - ලකුණු 05</u><br><br>(නායකත්වය, පෞරුෂත්වය, සන්නිවේදන කුසලතා, ආකල්ප යනාදිය සළකා බලනු ලැබේ) | 05 | |
| | මුළු ලකුණු | 100 | 100 |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024.01.16 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම - 04

<u>මධ්‍යම පළාත් සභාවේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය</u>

01. විභාගයේ නම : III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය කළමනාකරණය | පැය 03 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : ලේකම් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

04. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට අවම වශයෙන් දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය කළමනාකරණය | කළමනාකරණ මූලධර්ම<br>කළමනාකරණ ශ්‍රිතයන්<br>සහභාගීත්ව කළමනාකරණය<br>කළමනාකරණ |

ඉවත් කිරීම

අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා අනුමත කර ඇත්තේ III හා II ශ්‍රේණි පමණක් වන බැවින් 3 වන කාර්යක්ෂමතා කඩ ඉමට අදාළ ඇමුණුම 01 අවශ්‍ය නොවන බැවින් ඉවත් කිරීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024.01.16 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් සේවා කොමිෂන් සභාවේ නිර්දේශය - නිර්දේශ කරමු.

| | | | |
|---|---|---|---|
| 01. | ගාමිණී රාජරත්න මහතා | (සභාපති) | ........................ |
| 02. | ඩබ්ලිව්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා | (සාමාජික) | ........................ |
| 03. | ජේ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා | (සාමාජික) | ........................ |
| 04. | ජේ.එම්. වයිස් මහතා | (සාමාජික) | ........................ |
| 05. | එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා | (සාමාජික) | ........................ |
| 06 | ජේ.ඩී.කේ.වික්‍රමරත්න මහතා | (සාමාජික) | ........................ |
| 07. | පී.ටී.ජී.ගුණතිලක මයා | (සාමාජික) | ........................ |

දිනය 2023.12.28

ආණ්ඩුකාර ලේකම්,

2023.12.28 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2023/2586 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණය ( SL 1 – 2006) යටතේ වන සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සංශෝධන අංක - 02 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2024/01/10

.......................................

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

නිල මුද්‍රාව -

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : අනුමත කරමි. / නොකරමි.

2024.01.16

නීතිඥ ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත